# ප්‍රණාම PRANĀMA

මහාචාර්ය නන්දසේන මුදියන්සේ
අභිනන්දන

## PROFESSOR NANDASENA MUDIYANSE
## FELICITATION

# ගල් විහාර ප්‍රතිමා හඳුනා ගැනීමේ ප්‍රයත්නයක්

අනුර මනතුංග

පොළොන්නරුවේ ගල්විහාරය පැරණි උත්තරාරාමය ලෙස හඳුනාගෙන තිබීම නිවැරදි බව අවිවාදයෙන් පිළිගත හැකිය. එහෙත් එහි ඇති ප්‍රතිමා එකිනෙක වෙන් කොට හඳුනාගෙන ඇති ආකාරය බෙහෙවින් මතභේදයට හේතු වී ඇත. මහා පරාක්‍රමබාහු රජු විසින් උත්තරාරාමයේ බුද්ධ ප්‍රතිමා තුනක් කර වූ බව මහාවංසයේ සඳහන් වීමත්, ගල්විහාරයේ ප්‍රතිමා තුනක් නොව හතරක් ම දක්නට ලැබීමත් මෙම මතභේදයේ පදනම ලෙස පෙන්වා දිය හැකිය. තව ද ඒ අතර ඇති හිටි පිළිමය එහි දුර්ලභ මුද්‍රාව නිසා විවිධාකාර අර්ථනිරූපණයන්ට විෂය වී ඇත. මේ ලිපිය මගින් මා උත්සාහ කරන්නේ ගල්විහාරය සම්බන්ධව මතභේදයට ලක් වී ඇති එකී මූලික කරුණු නිරාකරණය කිරීමටය.

ගල්විහාරයේ දක්නට ලැබෙන්නේ, වම් පස සිට දකුණට පිළිවෙළින්, සුවිශාල හිඳි පිළිමය, ඇතුළට හැරූ ලෙන තුළ පිහිටි කුඩා හිඳි පිළිමය, හිටි පිළිමය සහ ඔත් පිළිමය යන ප්‍රතිමා හතරය.

මුලින් කී සුවිශාල හිඳි පිළිමය වජ්‍රාසනයක් මත ධ්‍යාන මුද්‍රාවෙන් වැඩ සිටින ආකාරයට නිර්මාණය කොට ඇත. එහි ආසනයේ ඉදිරිපස සහ පැත්තෙන් උක්කුටයෙන් සිටින සිංහ රූපයක් සහ විශ්ව වජ්‍රය එකකට පසු එකක් බැගින් යොදා ඇත. ප්‍රතිමාව වටා ප්‍රභා මණ්ඩලයක් ඇති අතර එහි පිටුපසින් ගරාදි තොරණක් දැකිය හැකිය. එම තොරණේ හරස් ගරාදි මකර මුඛයන්ගෙන් කෙළවර වන ආකාරයට නිර්මාණය කොට ඇත. තොරණේ ඉහළ කොටස විමානවලට බෙදා ඇති අතර, එම විමාන අතර ධ්‍යාන මුද්‍රාවෙන් යුත් කුඩා බුද්ධ ප්‍රතිමා හතරක් දැකිය හැකිය.